# ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය

## අධ්‍යයන පුරප්පාඩු

## තොරතුරු පත්‍රිකාව

ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ පහත සඳහන් අධ්‍යයන තනතුරු සඳහා සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්ගෙන් **2025.09.17** දින දක්වා අයදුම්පත් කැඳවනු ලැබේ.

➢ **බෞද්ධ අධ්‍යයන පීඨය**

**01. කථිකාචාර්ය (ආධුනික)/කථිකාචාර්ය (ස්ථිර නොකළ)/ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II/I ශ්‍රේණිය තනතුරු**

I. බෞද්ධ සංස්කෘතිය
II. සමය අධ්‍යයන හා තුලනාත්මක දර්ශනය

**02. කථිකාචාර්ය (තාවකාලික) තනතුරු**

III. බෞද්ධ සංස්කෘතිය
IV. සමය අධ්‍යයන හා තුලනාත්මක දර්ශනය

**03. පරිගණක තාක්ෂණය පිළිබඳ උපදේශක - II ශ්‍රේණිය**

➢ භාෂා අධ්‍යයන පීඨය

**04. කථිකාචාර්ය (ආධුනික)/කථිකාචාර්ය (ස්ථිර නොකළ)/ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II/I ශ්‍රේණිය තනතුරු**

**I.** පාලි
**II.** සිංහල
**III.** දෙමළ භාෂාව
**IV.** කොරියන් භාෂාව

05. කථිකාචාර්ය (තාවකාලික) තනතුරුඃ

V. ඉංග්‍රීසි
VI. ජපන් භාෂාව
VII. ප්‍රංශ භාෂාව

* (අදාළ අයදුම්කරුවන්ට සිංහල හා ඉංග්‍රීසි මාධ්‍ය දෙකෙන් ම ඉගැන්වීමට හැකියාව තිබිය යුතුය.)

**අධ්‍යයන තනතුරු සඳහා සුදුසුකම්ඃ**

➢ **කථිකාචාර්ය (ආධුනික)**

(1) පළමු හෝ දෙවන පෙළ (ඉහළ) ගෞරව සාමාර්ථ්‍යයක් සහිතව අදාළ විෂය පිළිබඳ විශේෂ උපාධියක් ලබා තිබීම සහ ඉගැන්වීමේ / පර්යේෂණ / වෘත්තීය කටයුතු / පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු පිළිබඳ අවම වශයෙන් අවුරුදු 01 ක පළපුරුද්දක් ලබා තිබීම.

හෝ

(2) දෙවන පෙළ (පහළ) ගෞරව සාමර්ථ්‍යයක් සහිතව අදාළ විෂය පිළිබඳ විශේෂ උපාධියක් ලබා තිබීම සහ ඉගැන්වීම් / පර්යේෂණ / වෘත්තීය කටයුතු / පශ්චාත් උපාධි අධ්‍යයන පිළිබඳ අවම වශයෙන් අවුරුදු 01 ක පළපුරුද්දක් ලබා තිබීම.

හෝ

(3) (අ) ගෞරව සාමාර්ථ්‍යයක් සහිතව අදාළ විෂය පිළිබඳ විශේෂ උපාධියක් ලබා තිබීම හෝ අවම වශයෙන් දෙවන පන්තියේ ගෞරව සාමාර්ථ්‍යයක් සහිතව වෙනත් ඕනෑම උපාධියක් ලබා තිබීම සහ

(ආ) උපාධි නිබන්ධයක / ශාස්ත්‍රීය නිබන්ධයක ආකාරයෙන් වූ පර්යේෂණ අංගයක් සමඟ අවම වශයෙන් අධ්‍යයන වර්ෂ 02 ක කාලයක් සහිතව අදාළ විෂයයෙන් පශ්වාද් උපාධියක් ලබා තිබීම.

හෝ

(4) අදාළ උසස් අධ්‍යාපන ආයතනයේ නිර්දේශ මත විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් අනුමත කළ හැකි එවැනි අධ්‍යයන හෝ වෘත්තීය සුදුසුකම් හෝ වෘත්තීය පළපුරුද්ද.

## ➢ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (II ශ්‍රේණිය)

(1) කථිකාචාර්ය (ආධුනික) තනතුරු සඳහා බඳවා ගැනීමට අවශ්‍ය සුදුසුකම් අපේක්ෂකයින් සතුව තිබිය යුතුය.

සහ

(2) (I) උපාධි නිබන්ධයක / ශාස්ත්‍රීය නිබන්ධයක ආකාරයෙන් වූ පර්යේෂණ අංගයක් සහිතව අවම වශයෙන් අධ්‍යයන වර්ෂ දෙකක (හෝ ඊට සමාන අර්ධ කාලීන අධ්‍යයන පාඨමාලාවක්) පූර්ණ කාලීන පාඨමාලාවක් හැදෑරීමෙන් අනතුරුව අදාළ විෂයයෙන් ලබා ගත් ශාස්ත්‍රපති උපාධියක් ලබා තිබීම හෝ ආචාර්ය උපාධියක් ලබා තිබීම.

කලා, මානව ශාස්ත්‍ර, සමාජවිද්‍යා, නීතිය හා කළමනාකරණ / ව්‍යාපාර අධ්‍යයන යන පීඨ සම්බන්ධයෙන් වන අවස්ථාවක, වර්තමාන මාර්ගෝපදේශවලට අනුකූලව ඇගයීමට ලක් කළ පර්යේෂණ වාර්තාවක් සමග සංයුක්ත කළ වසරක කාලසීමාවක් තුළ දී අදාළ ක්ෂේත්‍රයෙන් ලබා ගත් ශාස්ත්‍රපති උපාධියක් පිළිගත හැකි වනු ඇත.

හෝ

(II) අදාළ උසස් අධ්‍යාපන ආයතනයේ නිර්දේශ මත විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත කළ හැකි එවැනි වෘත්තීය සුදුසුකම් සහ පළපුරුද්ද.

සහ

(3) පහත සඳහන් එකක් හෝ වැඩි සංඛ්‍යාවක අවම වශයෙන් අවුරුදු හයක (06) පළපුරුද්දක් ලබා තිබීම:-

(i) විශ්වවිද්‍යාල මට්ටමින් ඉගැන්වීම,
(ii) වෘත්තීය පළපුරුද්ද,
(iii) පිළිගත් ආයතනයක පර්යේෂණ සිදුකර තිබීම,
(iv) ඉහත (2) හි සඳහන් සුදුසුකම් ලබා ගැනිම සඳහා පශ්චාද් උපාධි අධ්‍යයන කටයුතු සිදුකර තිබීම.

**සටහන:**
**වැඩිදුර තොරතුරු සඳහා**

**විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 935,**
**විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 721,**
**විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 07/2018,**
**විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍ර ලේඛ අංක 08/2016**

## ➢ කථිකාචාර්ය (තාවකාලික)

I. අදාළ විෂය පිළිබඳ ප්‍රථම පන්තිය හෝ දෙවන පන්තිය (ඉහළ පෙළ) සාමාර්ථ්‍යයක් සහිත ගෞරව උපාධියක් ලබා තිබීම.

හෝ

II. අදාළ විෂය පිළිබඳ දෙවන පන්තිය (පහළ පෙළ) සාමාර්ථ්‍යයක් සහිත ගෞරව උපාධියක් ලබා තිබීම.

හෝ

III. (a) අදාළ විෂය පිළිබඳ විශේෂ උපාධියක් හෝ අදාළ විෂය සහිතව දෙවන පෙළ සාමාර්ථ්‍යයක් සහිත උපාධියක්

සහ

(b) අදාළ විෂය පිළිබඳ පශ්චාත් උපාධියක් ලබා තිබීම.

## ➢ පරිගණක තාක්ෂණය පිළිබඳ උපදේශක - II ශ්‍රේණිය

(i) පිළිගත් විශ්වවිද්‍යාලයකින් පළමු හෝ දෙවන පන්තියේ සාමර්ථ්‍යයක් සහිතව පරිගණක විද්‍යාව/ පරිගණක ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී (විශේෂ) උපාධියක් ලබා තිබීම:

හෝ

(ii) (අ) පිළිගත් විශ්වවිද්‍යාලයකින් පරිගණක විද්‍යාව /පරිගණක ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විශේෂ උපාධිය සමත්ව තිබීම

හෝ

පිළිගත් විශ්වවිද්‍යාලයකින් පරිගණකකරණය විෂය සංරචකයක් වශයෙන් හදාරමින් පළමු හෝ දෙවන පන්තියේ සාමර්ථ්‍යයක් සහිතව විද්‍යාවේදී (සාමාන්‍ය) උපාධියක් ලබා තිබීම.

සහ

(ආ) ක්ෂේත්‍රයේ හෝ පරිගණකකරණයේ එක් වසරක පළපුරුද්දක් ලබා තිබීම.

හෝ

(iii) (අ) පිළිගත් විශ්වවිද්‍යාලයකින් පරිගණකකරණය විෂය සංරචකයක් වශයෙන් හදාරමින් විද්‍යාවේදී (සාමාන්‍ය) උපාධිය සමත්ව තිබීම.

හෝ

පිළිගත් විශ්වවිද්‍යාලයකින් පළමු හෝ දෙවන පන්තියේ සාමර්ථ්‍යයක් සහිතව විද්‍යාවේදී (සාමාන්‍ය) උපාධිය (පරිගණකකරණය විෂය සංරචකයක් නොවන) ලබා තිබීම.

<u>සහ</u>

(ආ) ක්ෂේත්‍රයේ හෝ පරිගණකකරණයේ වසර දෙකක පළපුරුද්ද.

(iv) (අ) පිළිගත් විශ්වවිද්‍යාලයකින් විද්‍යාවේදී (සාමාන්‍ය) උපාධිය (පරිගණකකරණය විෂයයක් නොවන) සමත්ව තිබීම.

සහ

(ආ) ක්ෂේත්‍රයේ හෝ පරිගණකකරණයේ වසර තුනක පළපුරුද්දක් ලබා තිබීම.

හෝ

(v) වෙනත් ඕනෑම උපාධියක්

සහ

පිළිගත් විශ්වවිද්‍යාලයකින් පරිගණක විද්‍යාව / පරිගණක තාක්ෂණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ලබා තිබීම.

සහ

ක්ෂේත්‍රයේ හෝ පරිගණකකරණයේ එක් වසරක පළපුරුද්දක් ලබා තිබීම.

**වැඩිදුර තොරතුරු සඳහා**

**විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍ර ලේඛ අංක 725**

**සටහන**

*** කථිකාචාර්ය (ආධුනික)/කථිකාචාර්ය (ස්ථිර නොකළ)/ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II/I ශ්‍රේණිය තනතුරු සඳහා බඳවා ගනු ලබන්නන් පළමු පත්වීම් දිනයේ සිට වසර 05ක් (පහක්) සඳහා වූ අඛණ්ඩ සේවාවක් පවත්වන බවට විශ්වවිද්‍යාලය සමඟ ගිවිසුමකට එළඹිය යුතු ය.**

**(I) වැටුප් පරිමාණය**

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (I ශ්‍රේණිය) - U-AC 3(I) - රු. 160,520-7x3,900-187,820 (මාසික)
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (II ශ්‍රේණිය) -U-AC 3(II) - රු. 138,980-11x2,940-171,320 (මාසික)
කථිකාචාර්ය (ස්ථිර නොකළ) - U-AC 3(III) - රු. 121,340-5x2,940-136,040 (මාසික)
කථිකාචාර්ය (ආධුනික) - U-AC 3(IV) - රු. 94,400-10x2,400-118,400 (මාසික)
පරිගණක උපදේශක (II ශ්‍රේණිය) -U-AS 2 (II) - රු.85,305-3x2,400-92,505 (EB) 94,905 – 14 x 2,400 – 128,505 (මාසික)

* ස්ථිර අධ්‍යයන කාර්ය මණ්ඩල තනතුරු සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛානුකූලව හිමි අනෙකුත් දීමනා සඳහා හිමිකම් ඇත.

කථිකාචාර්ය (තාවකාලික) - U-AC 2 - රු.85,305/- (මාසික)

**ව්‍යවස්ථාපිත ප්‍රතිලාභ**

- තනතුරට පත් කිරීමෙන් පසු අදාළ තනතුරට හිමි මාසික වැටුපෙන් සේවා දායකයාගෙන් 10% හා සේවා යෝජකයා විසින් 15%ක මුදලක් විශ්වවිද්‍යාලයීය අර්ථ සාධක අරමුදලට දායක කරනු ඇත. තවද සේවා යෝජකයා විසින් මාසික වැටුපෙන් 3%ක මුදලක් සේවා නියුක්තියන්ගේ භාරකාර අරමුදලට දායක කරනු ඇත.

- පාරිතෝෂික දීමනාව

**අනෙකුත් ප්‍රතිලාභ**

- ❖ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් නිකුත් කරනු ලබන චක්‍රලේඛ ප්‍රකාර ව හිමි අනෙකුත් දීමනා
- ❖ විශ්වවිද්‍යාලයේ වෛද්‍යාධාර යෝජනා ක්‍රමයට දායක කරගනු ඇත.

**අයදුම් කළ යුතු ආකාරය :**

**සුදුසුකම් දක්වා ඇති තොරතුරු පත්‍රිකා සහ අයදුම්පත් 2025.09.10** දින දක්වා මෙම විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී (පාලන) කාර්යාලයට පෞද්ගලික ව පැමිණීමෙන් හෝ තම නම, ලිපිනය ලියූ මුද්දර ගැසූ (රු. 120.00) ලිපි කවරයක් (සෙ.මී. 23 x 10 ප්‍රමාණයේ) මෙම විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී (පාලන) වෙත එවීමෙන් (කවරයේ ඉහළ වම් කෙළවරෙහි අදාළ තනතුර සඳහන් කළ යුතුය) නැතහොත් විශ්වවිද්‍යාලයීය වෙබ් අඩවියෙන් (www.bpu.ac.lk) බාගත කළ හැකිය.

නිසි ලෙස සම්පූර්ණ කරන ලද අයදුම්පත් සමඟ සුදුසුකම් දැක්වෙන අදාළ සහතිකවල හා පළපුරුද්ද ඇතුළත් සහතිකවල සහතික කළ ඡායා පිටපත් ද සහිතව ලිපි කවරයක බහා එහි ඉහළ වම් කෙළවරෙහි තමන් විසින් අයදුම්කරනු ලබන තනතුර පැහැදිලිව සඳහන් කර **2025.09.17** දින හෝ ඊට පෙර **"ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී (පාලන), ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය,නො. 37, මොරගහහේන පාර, පිටිපන නගරය, හෝමාගම."** යන ලිපිනය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ලියාපදිංචි තැපැල් කුවිතාන්සියේ පිටපතක් ලිපි කවරයේ අමුණා එවිය යුතුය.

රජයේ දෙපාර්තමේන්තු / සංස්ථා/ ව්‍යවස්ථාපිත මණ්ඩල/ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතනවල සේවා නියුක්තිකයන් විසින් එවනු ලබන අයදුම්පත් තම ආයතන ප්‍රධානියා මගින් එවීමට කටයුතු කළ යුතු ය.

ඉහත සඳහන් කළ අවශ්‍යතාවන්ට අනුගත නොවූ, අසම්පූර්ණ, අපහැදිලි හෝ පමා වී ලැබෙන අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොර ව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

ලේඛකාධිකාරී (වැඩබලන)
ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය
නො. 37, මොරගහහේන පාර,
පිටිපන නගරය,
හෝමාගම.
2025.08.17.